## තේ වගාව

සිංකෝනා වගාව සාර්ථක නොවන බව පැහැදිලි වෙත්ම ව්‍යාපාරිකයෝ තේ වගාව කෙරෙහි සිත් යොමු කළහ.


ක්‍රි.ව. 1873 දී පමණ සුළු වශයෙන් ඇරඹුණු තේ වගාව අවුරුදු 10 ක් ගත වීමටත් පෙර සීඝ්‍රයෙන් ව්‍යාප්ත වනු දක්නට ලැබිණි. 1875 වනවිට තේ වගාව අක්කර 500ක පමණ ප්‍රදේශයක පැතිරී තිබූ අතර 1887 පමණ වනවිට එය අක්කර 1,50,000 දක්වා ප්‍රමාණයක ව්‍යාප්ත වී තිබිණි. 1890 පමණ වන විට තේ වගාවේ විශාල දියුණුවක් ඇති විය. තේ වගාවේ දියුණුව සඳහා කරුණු රැසක් බල පා ඇත.



රූපය 2.3 තේ වත්තක්

**තේ වගාව ව්‍යාප්ත වීමට බල පෑ හේතු :-**

- ලන්ඩන් වෙළෙඳපොලේ තේ මිල ඉහළයාම
- නිෂ්පාදන වැඩි වැඩියෙන් යාන්ත්‍රික වීම
- පොහොර භාවිතය වැඩිවීම
- දුම්රිය මාර්ග හා වෙනත් පහසුකම් ඇතිවීම
- කොළඹ වරාය දියුණු කිරීම
- තේ නිපදවීම සඳහා දැරිය යුතු වියදම් අඩු මට්ටමක පැවතීම
- ලන්ඩන් වෙළෙඳපොළේ චීන තේවලට තිබූ ඉල්ලුම අඩු වී ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ තේ සඳහා ඉල්ලුම ඉහළ යාම
- දකුණු ඉන්දියානු කුලීකරුවන් ගෙන ඒම නිසා ශ්‍රමය පහසුවෙන් ලබාගත හැකිවීම





2.1 සිතියම

තේ වගාවට වැළඳෙන රෝග පිළිබඳවත් අඩු වියදමකින් වැඩි ඵලදාවක් ලබා ගැනීම පිළිබඳවත් පර්යේෂණ පැවැත්වීම සඳහා 1925 දී තලවකැලේ තේ පර්යේෂණාගාරයක් පිහිටුවනු ලැබී ය. පළමු වන ලෝක යුද්ධ අවධියේ තේ වගා කරන රටවල එකතු වී තිබූ තේ තොග යුද්ධයෙන් පසුව වෙළෙඳ පොලට පැමිණීම නිසා තේ මිල පහත බසින්නට විය. එසේ වුව ද 1920 පමණ වනවිට නැවත තේ මිල ඉහළ යන්නට වීමත් සමඟ අලුතෙන් ඉඩම්වල තේ වගා කිරීම පටන් ගන්නා ලදී. එහෙත් 1929 ඇති වූ ලෝක ආර්ථික පරිහානියත් සමඟ යළිත් වරක් තේ අපනයනය කිරීම අඩු වී තේ වලින් ලැබූ ආදායම ද අඩුවන්නට විය. ඒ පරිද්දෙන් ආරම්භයේ සිට ම ලෝක වෙළෙඳපොලේ මිල වරින් වර ඉහළ පහළ ගිය නමුත් 1920 පමණ වනවිට ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳ ද්‍රව්‍ය අතර තේවලට ලැබුණේ ප්‍රධාන තැනකි.

## පොල් වගාව

බ්‍රිතාන්‍ය පාලනය යටතේ 19 වැනි සියවසේදී වර්ධනය වූ තවත් වගාවක් නම් පොල් වගාව යි. අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ පොල් වගාව පැවති අතර ලන්දේසීන් ද ඔවුන් යටතේ මුහුදුබඩ ප්‍රදේශවල පොල් වගා කිරීම කෙරෙහි උනන්දු වූ බව පෙනේ. අමු පොල්, පුන්නක්කු, කපාපු පොල්, කොප්පරා, කොහු, කොහු ලණු ආදිය මේ යුගයේ වැදගත් අපනයන ද්‍රව්‍ය විය. 19 වැනි සියවසේ අගභාගයේ පමණ මෙම ද්‍රව්‍ය අපනයනය කිරීම ආරම්භ විය.





2.2 සිතියම

තේ වගාව සහ කෝපි වගාව පිළිබඳව යුරෝපීයයන් උනන්දුවක් දැක්වුව ද ඔවුහු පොල් වගාව පිළිබඳ එතරම් උනන්දුවක් නොදැක් වූහ. එබැවින් ආරම්භයේ සිට ම පොල් වගාව ස්වදේශිකයන් ගේ පාලනය යටතේ ම පැවතිණි. එසේ වුවද කපාපු පොල් නිපදවීම වැනි පොල් නිෂ්පාදන කටයුතු සහ ඒවා විදේශ වෙළෙඳපොළට යැවීමේ ව්‍යාපාරය සම්පූර්ණයෙන් ම යුරෝපීය වාණිජ සමාගම් සතු විය. 1910 පමණ වනවිට අක්කර 8,50,000 ක් පමණ භූමි ප්‍රමාණයක පොල් වගා කොට තිබිණි. 1920 පමණ වන විට විදේශ විනිමයෙන් 27% ක් පමණ පොල් නිෂ්පාදන අපනයනයෙන් උපයාගත හැකි විය. ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනයෙන් අඩක් පමණ දේශීය පරිභෝජනය සඳහා යොදාගත් අතර ඉතිරි කොටස අපනයනය කරනු ලැබී ය. පොල් වගාවේ වර්ධනයත් සමග පොල් වගාව වඩාත් ව්‍යාප්ත කිරීම සහ එමගින් කළ හැකි නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සඳහා ලුණුවිල පොල් පර්යේෂණාගාරයක් ද පිහිටුවනු ලැබී ය.

## රබර් වගාව

19 වැනි සියවස අවසානය වනවිට බ්‍රිතාන්‍යයන් විසින් රබර් වගාව හඳුන්වා දීම නිසා තවත් ආර්ථික බෝගයක් එකතු විය. කෝපි වගාව පිරිහීමත් සමඟ මධ්‍ය කඳුකරයේ තේ වගාව සිදු කෙරුණ අතර කළුතර, රත්නපුර, කෑගල්ල ආදි දිස්ත්‍රික්කවල රබර් වගාව ආරම්භ විය. වෙළෙඳ වැවිල්ලක් ලෙස රබර් වගාව ආරම්භ වුයේ 1870 ගණන්වල දී ය. මෝටර් රථ කර්මාන්තයේ වර්ධනයත් සමඟ රබර් භාවිතය ද වැඩිවන්නට විය. 1913 වනවිට ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් අක්කර 2,20,000ක් පමණ ප්‍රදේශයක රබර් වගාව ව්‍යාප්ත වී තිබිණි.




**2.3 සිතියම**

රබර් වගාවේ ව්‍යාප්තියට බල පෑ හේතු :-

- පළමු වන ලෝක යුද්ධ සමයේ රබර් මිල ඉහළ යාම
- ඇමෙරිකා එක්සත් ජනපදය විශාල වශයෙන් මෙරටින් රබර් මිලදී ගැනීම
- බ්‍රිතාන්‍යයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ මෝටර් රථ කර්මාන්තය දියුණු වීම

1929 දී ඇති වූ ලෝක ආර්ථික පරිහානිය ශ්‍රී ලංකාවට ද බල පෑ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් රබර් මිල ද පහත බසින්නට විය.

ඉහත දැක් වූ කරුණු අනුව 1948 නිදහස ලැබූ අවධිය වනවිට වාණිජ බෝග වගාව පදනම් කොට ගත් අර්ථ ක්‍රමයක් ශ්‍රී ලංකාව තුළ මුල් බැස ගෙන තිබිණි.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම්**

- ශ්‍රී ලංකාවේ සිතියමක තේ, පොල් සහ රබර් වගාව ව්‍යාප්තව පවතින ප්‍රදේශ ලකුණු කරන්න.
- කෝපි, තේ, පොල් සහ රබර් වගාව ආරම්භ වීමට හේතු වූ කරුණු වගු ගත කරන්න.

## පාරම්පරික කෘෂිකර්මය (ගොවිතැන් කටයුතු)

අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජීවනෝපාය වූයේ ගොවිතැන යි. 13 වැනි සියවස පමණ වනවිට ජලාශ්‍රිත ශිෂ්ටාචාරය බිඳ වැටී ක්‍රමයෙන් ජනතාව තෙත් කලාපයට සංක්‍රමණය වන්නට වූහ. එම ප්‍රදේශවල පැවති අධික වර්ෂාව නිසා විශාල වාරි කර්මාන්තවල අවශ්‍යතාවක් නොවී ය.

කුළු බඩු, ඇත්දත්, මුතු මැණික් වැනි වෙළෙඳ ද්‍රව්‍ය විදේශවලට අලෙවි කිරීමේ වෙළෙඳාම පුළුල් විය. ඒ හේතු කොට ගෙන වාරි කර්මාන්තයටත් කෘෂිකර්මාන්තයටත් පෙර තිබූ සැලකිල්ල අඩුවන්නට විය. තෙත් කලාපයේ කොස් , දෙල් , අල වර්ග ආදි වෙනත් ආහාර වර්ග බහුල වූ හෙයින් වී වගාව මත ම යැපීමට අවශ්‍ය නොවී ය. මේ නිසා 13 වැනි සියවසේ පටන් මෙරට වී වගාව කෙරෙහි වූ උනන්දුව අඩු විය.

පෘතුගීසී පාලන සමයේදී තවදුරටත් වී වගාව පිරිහී ගියේ ය. වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීමෙන් හා ඉන්දියාවෙන් වහලුන් ගෙන්වීමෙන් නැවත කෘෂිකාර්මික කටයුතු නංවාලීමට ලන්දේසීන් උත්සාහ කළ ද එය එතරම් සාර්ථක නොවී ය. පෘතුගීසීන් හා ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අවධියේ මෙන් ම බ්‍රිතාන්‍ය යුගයේ දී ද ගොවිතැන් කටයුතුවල එතරම් සාර්ථක බවක් දක්නට නො ලැබිණි.

වතු වගාව කෙරෙහි දැඩි උනන්දුවක් දැක් වූ බ්‍රිතාන්‍ය ආණ්ඩුවට දේශීය ගොවිතැන් කටයුතු කෙරෙහි සැලකිල්ලක් දක්වන්නට අවශ්‍ය නොවී ය. එසේ වුවත් මුල් කාලයේ සිටි නෝර්ත් සහ මේට්ලන්ඩ් වැනි ආණ්ඩුකාරවරු වාරිකර්මාන්ත පිළිසකර කරවා වී වගාව දියුණු කිරීමට උත්සාහ කළහ. එහෙත් ඒවා එතරම් සාර්ථක වී නො තිබිණි.

වතු වගා ව්‍යාපාරයට රජයේ අනුග්‍රහ ලබාදුන් 1833 ප්‍රතිසංස්කරණ යටතේ ගොවිතැන් කටයුතු සීඝ්‍රයෙන් පරිහානියට පත් විය. ඊට තුඩුදුන් හේතු කිහිපයකි.

01. ශ්‍රී ලංකාවේ වැඩි පිරිසකගේ ජීවනෝපාය වූ ගොවිතැන් කටයුතු සඳහා රජයෙන් අනුග්‍රහයක් නො ලැබිණි.

02. වැවිලිකරුවන්ට රජයෙන් දුන් ආධාර ද වක්‍රාකාරයෙන් ගොවි ජනතාව කෙරෙහි අහිතකර ලෙස බලපෑවේ ය. රජය වැවිලි ව්‍යාපාරයට සහාය දීමේ පියවරක් වශයෙන් 1840 දී පනවන ලද අංක 12 දරණ මුඩුබිම් පනත ඊට නිදසුනකි. ඒ අනුව කිසියම් පුද්ගලයකු විසින් අවුරුදු 30 ක් තිස්සේ නොකඩවා භුක්ති වින්ද බවට උසාවියට පිළිගත හැකි නිත්‍යානුකූල සාධක ඉදිරිපත් කළ නොහැකි සියලු මුඩු ඉඩම් රජයේ ඉඩම් ලෙස පිළිගනු ලැබී ය. අනතුරුව ඒවා වැවිලිකරුවන්ට මිලදී ගැනීමට හැකි වන ලෙස නීති සකස් කෙරිණි. දේශීය ඉඩම් භුක්ති ක්‍රමය අනුව ඔප්පු තිරප්පු කිසිවක් නොතිබූ බැවින් කිසියම් ඉඩමක් අවුරුදු 30ක් භුක්ති වින්ද බවට ඉදිරිපත් කළ හැකි සාධක කිසිවක් මෙරට ජනතාවට නො තිබිණි. මේ නිසා ගැමියන්ගේ ඉඩම් අහිමි වී ගොවිතැන් කටයුතු පිරිහී ඔවුහු ඉතා අසරණ තත්ත්වයකට පත්වූහ.

03. වතු වගාව සඳහා බොහෝ දුරට භාවිත වූයේ කඳුකර ප්‍රදේශවල ඉඩම් ය. මේ ඉඩම් එළි පෙහෙළි කිරීම නිසා පහළ පිහිටි බිම් ප්‍රදේශවල තිබූ කුඹුරු ඉඩම් විනාශ විය.

04. වනාන්තර එළි පෙහෙළි කිරීම නිසා ගොවිතැන් සඳහා අවශ්‍ය ජල උල්පත් සිඳී ගියේ ය.

05. දේශීය ක්‍රමය අනුව වාරි කටයුතු නඩත්තු කිරීම වැනි කාර්යයන් සිදු වූයේ අනිවාර්ය සේවා රාජකාරිය උපයෝගි කොට ගෙන ගම් සභාව මඟිනි. 1833 ප්‍රතිසංස්කරණ යටතේ ගම් සභාව නොසලකා හැර අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අවලංගු කෙරුණු බැවින් දේශීය ගොවිතැන් කටයුතු අඩපණ වන්නට විය.

වතුවගාව නිසා ඇති වූ නව ආර්ථික හා දේශපාලන වෙනස්වීම් ගොවිජනතාව කෙරෙහි අහිතකර ලෙස බලපෑවේ ය. 1848 දී ඉංග්‍රීසින්ට විරුද්ධව පැන නැඟි දෙවන විමුක්ති අරගලයට දායක වූ ප්‍රධාන බලවේගය වූයේ මේ ගොවි ජනතාව යි.

ඒ පරිද්දෙන් 19 වන සියවසේ මුල් භාගයේ දී බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ප්‍රතිපත්ති හමුවේ ගොවිතැන් කටයුතු පරිහානියට පත් වූ බව 1848 සටනින් පසුව කරන ලද පරීක්ෂණවලදී පැහැදිලි විය. එහෙයින් 1850 න් පමණ පසු කාලය තුළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරුන් කිහිප දෙනෙක් ගොවි ජනතාවගේ තත්ත්වය කෙරෙහි සැලිකිලිමත් වන්නට වූහ.

වාරි කර්මාන්ත පිළිසකර කොට ගොවිතැන් කටයුතු නඟා සිටුවීමට කටයුතු කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් කිහිප දෙනෙකු හඳුනා ගනිමු.

- 1855 - 1860 දක්වා ශ්‍රී ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා වූ හෙන්රි වෝඩ් නැගෙනහිර පළාතේ ඉරක්කාමම් වැව සහ අම්පාරේ වැව ද දකුණු පළාතේ කිරම සහ ඌරුබොක්ක වැව ද මාතලේ හා ඌව ප්‍රදේශවල කුඩා වැව් හා ඇළවේලි කිහිපයක් ද ප්‍රතිසංස්කරණය කරවී ය.
- 1866 හර්කියුලස් රොබින්සන් ආණ්ඩුකාරයා තිස්සමහාරාම වැව අලුත්වැඩියා කරවී ය.
- 1872 විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරයා කන්තලේ වැව ප්‍රතිසංස්කරණය කර වූ අතර කලා වැවේ සිට අනුරාධපුරය දක්වා ජලය ගෙනයාම සඳහා ධාතුසේන රජු විසින් කරවන ලද යෝධ ඇලේ කොටසක් ද ඔහු පිළිසකර කරවී ය.
- 1883 - 1890 ආතර් ගෝඩන් ආණ්ඩුකාරයා කලා වැව පිළිසකර කරවී ය. ඌව සහ සබරගමු පළාත්වල සුළු වාරිමාර්ග කීපයක් අලුත්වැඩියා කිරීම ද ඔහු විසින් සිදු කරන ලදී.
- 1896 දී වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරයා උතුරු පළාතේ යෝධ වැව සහ නාච්චදූව වැව ප්‍රතිසංස්කරණය කර විය.
- හෙන්රි ආතර් බ්ලේක් ආණ්ඩුකාරයා නුවරවැව ප්‍රතිසංස්කරණය කිරීම.
- මැකලම් ආණ්ඩුකාරයා මිනිපේ ඇළ ප්‍රතිසංස්කරණය කිරීම.

වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරයා වාරිකර්මාන්තය නඟා සිටුවීම සඳහා 1900 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටු විය. වාරි කර්මාන්ත පිළිබඳ හසල දැනුමක් ඇති අය පත් කර එම ක්ෂේත්‍රය දියුණු කිරීමටත් නව කර්මාන්ත සුදුසු පරිදි ආරම්භ කිරීමටත් කටයුතු සැලැස්වී ය.

ගොවිතැන් කටයුතු ගැන උනන්දුවක් දැක් වූ මෙම ආණ්ඩුකාරවරුන් නිසා අඩපණ වී ගිය ගොවිතැන් කටයුතු යම්තාක් දුරට හෝ නංවාලීමට ආධාර විය. ධාන්‍ය බද්ද අවලංගු කිරීමෙන් ආතර් හැව්ලොක් ආණ්ඩුකාරයා ද ගැමි ජනතාවට සෙත සැලසීමට කටයුතු කෙළේ ය.

ගැමි ජනයාට පහසු පොලී ප්‍රමාණයකට ණය දීමේ පරමාර්ථය ඇතිව 1911 දී සමුපකාර ණය දෙන සමිති පිහිටුවනු ලැබී ය. පසළොස් වසරක් ගතවන විට සමුපකාර සමිති 300 ක් පිහිටුවීමෙන් මේවා කෙතරම් සාර්ථක වූයේ ද යන්න පැහැදිලි වේ. ශ්‍රී ලාංකික ගොවි ජනතාවගේ යහපත සඳහා මෙම ණය දෙන සමිති වලින් විශාල සේවයක් ඉටු වූ බව කිව හැකි ය. ගැමි ජනතාවගේ ශුභ සිද්ධිය සැලසීම රජයේ ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන නොතිබුණ බැවින් සමහර ආණ්ඩුකාරවරු ඒ පිළිබඳ සොයා නො බැලූහ.

එහෙයින් ගැමි ජනතාවගේ යහපතට හේතු වූ ගොවිතැන් කටයුතු පරිහානියට පත් වීම අධිරාජ්‍යවාදීන් යටතේ ශ්‍රී ලංකාවට අත් වූ අතිශය විනාශකාරී ප්‍රතිඵලයකි.



රූපය 2.5
හර්කියුලීස් රොබින්සන්
ආණ්ඩුකාරයා



රූපය 2.6 විලියම් ග්‍රෙගරි
ආණ්ඩුකාරයා

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

- ගැමි කෘෂි කර්මාන්තය නඟා සිටුවීම සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන්ගෙන් සිදු වූ සේවාවන් පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- වතුවගාවේ ව්‍යාප්තියට සහ දේශීය ගොවිතැන් කටයුතුවල පිරිහීමට තුඩුදුන් කෝල්බෲක් කොමිසමේ නිර්දේශ වගුගත කරන්න.

බ්‍රිතාන්‍යයන් යටතේ වතුවගාව ව්‍යාප්ත වීමේ වැදගත් සමාජයීය ප්‍රතිඵල අතර ප්‍රධාන එකක් වූයේ නවීකරණය සහ බටහිරකරණයයි.

## නවීකරණය හා බටහිරකරණය

- සියවස් 20 කට අධික කාලයක් තිස්සේ දේශීය ඌරුවට හැඩ ගැසී වර්ධනය වෙමින් තිබූ මෙරට සභ්‍යත්වය බ්‍රිතාන්‍ය පාලනය යටතේ මුළුමනින් ම වෙනස් විය.

- එමඟින් 19 වැනි සියවස අග භාගයේදී ශ්‍රී ලංකාව ඉතා වේගයෙන් බටහිරකරණයට ගොදුරු වූ බව දැකිය හැකි ය.

  මෙරට ධනවාදී ආර්ථික ක්‍රමයක් කරා ගෙනයාමට අපේක්ෂා කළ ඉංග්‍රීසි පාලකයෝ ඊට අවශ්‍ය ධනහිමි පංතිය සහ කම්කරු පංතිය ද විදේශයන්ගෙන් මෙරටට ගෙන්වා ගත්හ.

- ක්‍රමයෙන් වර්ධනය වූ ධනවාදී ආර්ථිකය තුළ පුද්ගලික ව්‍යවසාය වර්ධනය විය.

- දේශීයත්වයට උරුම දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික ආදි සියලු ක්ෂේත්‍ර පරිහානියට පත් කරමින් බටහිර ආකාරයට හැඩ ගැසුණ සභ්‍යත්වයක් මෙරට ඉස්මතු විය. ඒ තුළ වර්ධනය වූ ප්‍රධාන ම අංග ලක්ෂණයක් වූයේ මධ්‍යම පංතිය සහ කම්කරු පංතිය බිහිවීම යි.

## මධ්‍යම පංතියේ වර්ධනය

ශ්‍රී ලංකාවේ මධ්‍යම පංතියක් බිහිවූයේ සුදුසුකම් දෙකක් පදනම් කොට ගෙන ය.

- ධනය හිමිකම
- උගත්කම

මෙරට පුද්ගලයන්ට මෙම සුදුසුකම් දෙකම ලබා ගැනීමට සුදුසු වාතාවරණයක් සලසා දුන්නේ 1833 දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ මඟිනි.

එම ප්‍රතිසංස්කරණවල එක් අංගයක් වූයේ ස්වදේශිකයන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා ඉංග්‍රීසින් යටතේ ආණ්ඩුවේ තනතුරු දැරීමට අවස්ථාව සලසා දීම යි. මෙසේ ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබූ පිරිස යුරෝපීය සංස්කෘතිය ගරු කරන දේශීය සංස්කෘතිය හෙළා දකින පිරිසක් බවට පත් විණි. එමඟින් ඔවුන් දේශීය සමාජයේ කැපී පෙනෙන ප්‍රභූ පිරිසක් ලෙස වර්ධනය වෙත්ම දේශීය සභ්‍යත්වය නොවැදගත් තත්ත්වයකට පත් විය.

බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ අනුග්‍රහය ඇතිව රට තුළ මිෂනාරි පාසල් විශාල සංඛ්‍යාවක් ආරම්භ වී තිබිණි. උසස් යැයි සම්මත දේශීය මුලාදෑනි පන්තියට අමතරව පහත් යැයි සම්මත කුලවල ධනවත් අයට ද මෙම පාසල් වලින් ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීමටත් එමඟින් ඉහළ තනතුරුවලට පත් වීමටත් අවස්ථාව උදා විය. රජයේ ඉහළ රැකියාවල හා

වෙනත් වෘත්තීන්හි යෙදුණු මෙම උගත් පිරිස 19 වැනි සියවස මැද හරියේ දී ඉංග්‍රීසි උගත් මධ්‍යම පන්තිය ලෙස සංවිධානය වීම කැපී පෙනෙන ලක්ෂණයකි.

යුරෝපීය සිරිත් විරිත් අනුගමනය කළ මෙම පිරිස අරක්කු, රේන්ද මිලදී ගැනීමෙන් හා වතු වගාවට අවශ්‍ය සේවා සැපයීමෙන් තම ධනය ද වර්ධනය කොට ගත් හ. මුහුදුබඩ ප්‍රදේශවලින් උඩරටට පැමිණි දේශීය ව්‍යාපාරිකයෝ වතුවගාවට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම, කැලෑ එළි පෙහෙළි කිරීම, ගොඩනැගිලි ඉදිකිරීම වැනි සේවාවන් සපයමින් මුදල් ඉපයූහ.

20 වන සියවසේ මුල් දශක වන විට ශ්‍රී ලංකාවේ මහා පරිමාණයේ පොල් වගාව මුළුමනින් ම පාහේ ශ්‍රී ලාංකික මධ්‍යම පන්තිකයින් සතු වී තිබිණි. කොළඹ, හලාවත හා කුරුණෑගල යා කරන ත්‍රිකෝණාකාර ප්‍රදේශයෙහි පිහිටි පොල් වතු මුළුමනින් ම ශ්‍රී ලාංකිකයන් සතු වීමෙන් ඒ බව පැහැදිලි වේ.

මිනිරන් කර්මාන්තයේ නිරත වීමෙන් විශාල ධනයක් උපයාගත් අය ද මෙම මධ්‍යම පංතිකයන් අතර ප්‍රමුඛයෝ වූහ.

එපරිද්දෙන් ධනය උපයාගත් අය එම ධනය උපයෝගී කොට ගෙන තම දරුවන්ට උසස් අධ්‍යාපනයක් ලබා දීමට කටයුතු කළහ. ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබූ ඔවුන්ට බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ද හිමි විය. මේ නිසා 20 වන සියවස වනවිට ඉංග්‍රීසීන් ක්‍රියාත්මක කළ ආර්ථික කටයුතුවල ප්‍රතිඵල වශයෙන් ධනය උපයා ගත්තා වූ ද ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉංග්‍රීසි උගතුන් බවට පත්වූවා වූ ද ස්වදේශිකයන්ගෙන් යුක්ත මධ්‍යම පංතියක් බිහි විය.

ධනය හා උගත්කම තිබුණ ද දේශීය ඉංග්‍රීසි උගත් මධ්‍යම පංතිකයන්ට දේශපාලන බලයක් නොවී ය. පාලන කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කෙළේ බ්‍රිතාන්‍යයන් විසිනි. ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා බටහිර පන්නයට හැඩගැසුණු මේ පිරිස අලුත් සමාජ බලවේගයක් බවට පත් වූහ. ඔවුහු පසුව තම පංතියේ ශක්තිය විදහා පෙන්වමින් දේශපාලන බලය ලබා ගැනීමේ ව්‍යාපාරයක නිරත වූහ. බ්‍රිතාන්‍ය පාලකයන් අතෙහි පැවති දේශපාලන බලතල තමන් අතට ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඔවුහු පසු කාලයේ ආණ්ඩුක්‍රම උද්ඝෝෂණ ව්‍යාපාරවල නිරත වූහ.

## කම්කරු ව්‍යාපාරය

දේශීය පාලන ක්‍රමය යටතේ රජයේ පොදු සේවාවන් සඳහා අවශ්‍ය ශ්‍රමය සපයා ගත්තේ නොමිලේ සැපයුණු අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය මගිනි. වැව් අමුණු තැනීම, ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම, මංමාවත් සෑදීම, ඒවා පිළිසකර කිරීම ආදිය මගින් රජයට තම සේවය සැපයූහ.

එසේ වුවත් බ්‍රිතාන්‍යයන් විසින් එම තත්ත්වය වෙනස් කරනු ලැබී ය. ශ්‍රී ලංකාවේ වතු වගාව ආරම්භ වීමත් සමඟ මෙරට ශ්‍රමය මුදලට විකිණීමේ ක්‍රමයක් ආරම්භ විය. නොමිලයේ සේවය ලබා ගැනීම වෙනුවට වේතන ගෙවා ශ්‍රමය ලබා ගැනීමට ඉංග්‍රීසීහු

කටයුතු කළහ. එසේ වුව ද දේශීය ජනතාව කිසි අයුරකින් හෝ ශක්තිමත් වනු දැකීමට බ්‍රිතාන්‍ය පාලකයෝ අකමැති වූහ. එහෙයින් වතුවල කටයුතු කිරීමට කැමති උඩරට සිංහලයන්ට පවා වැඩ නොදී ඔවුන් දරිද්‍රතාවයේ පතුලට ම යාමට ඉඩහැරීම සඳහා ඉන්දීය කම්කරුවෝ ගෙන්වා ගත්හ. එහෙයින් මධ්‍ය කඳුකරයේ කෝපි හා තේ වතුවල සේවය සඳහා දකුණු ඉන්දියාවෙන් ශ්‍රමිකයෝ ගලා එන්නට වූහ.

19 වැනි සියවස අවසාන වන විට කොළඹ, මහනුවර, ගාල්ල වැනි නගරවල බඩු බෑම, පැටවීම, රෙදි සේදීම, කරත්ත දැක්කීම වැනි විවිධ සේවාවන් සඳහා ශ්‍රමිකයන් අවශ්‍ය විය. දකුණු ඉන්දියාවෙන් ගෙන් වූ ශ්‍රමිකයන් වතුවල සේවයේ නියුතු වූ අතර 19 වැනි සියවස අවසාන වනවිට එම නාගරික කම්කරු පංතිය සමන්විත වූයේ සිංහලයන්ගෙනි.

> වතුවල මෙන් ම නගරවල ද බර වැඩ කළ නමුත් අඩු වේතනයක් ලැබූ ශ්‍රමිකයන්ගෙන් කම්කරු පංතිය සමන්විත විය. තව ද 19 වැනි සියවස අවසානය වන විට දේශීය නාගරික කම්කරුවන් හා ඉන්දියානු වතු කම්කරුවන් වශයෙන් මේ කම්කරුවෝ එකිනෙකට වෙනස් වූ කොටස් දෙකක් ලෙස වර්ධනය වූහ.

තම අයිතිවාසිකම් සඳහා මුලින්ම උද්ඝෝෂණ ආරම්භ කෙළේ නාගරික කම්කරුවන් විසිනි. එම කම්කරු කොටස ප්‍රධාන පරිපාලන හා වෙළෙඳ මධ්‍යස්ථානය වූ කොළඹ කේන්ද්‍ර කොටගෙන බිහි වූ බැවින් ඔවුන්ගේ උද්ඝෝෂණ ඇති වූයේ ද කොළඹ නගරය තුළ ය. 1893 දී කොළඹ මුද්‍රණකරුවන් විසින් ආරම්භ කරන ලද වැඩ වර්ජනය කම්කරු අරගලයක මුහුණුවර ගත් ප්‍රථම අවස්ථාව ලෙස දැක්විය හැකි ය. 19 වන සියවස අවසාන භාගයේදී මධ්‍යම පංතියේ ද සහාය ලබාගෙන කම්කරුවෝ වැඩ වර්ජන කීපයක් මෙහෙය වූහ.

- කරත්තකරුවන්ගේ වැඩ වර්ජනය
- වැල්ලවත්ත රෙදි මෝලේ වර්ජනය
- රෙදි සෝදන්නන්ගේ වර්ජනය

යනාදිය ඒ අතර ප්‍රධාන විය.



රූපය 2.7
ඒ. ඊ. ගුණසිංහ මහතා

මේ අතර කාලයේ ආරම්භ වූ ලංකා මුද්‍රණකරුවන්ගේ සංගමය ශ්‍රී ලංකාවේ පළමු වන වෘත්තීය සංගමය ලෙස දැක්විය හැකි ය. පසු කාලයේ විවිධ වෘත්තිකයන්ගෙන් සමන්විත කම්කරු සංවිධාන බිහිවන්නට වූ අතර 20 වැනි සියවස මුල් කාලය තුළ තම අයිතිවාසිකම් ඉල්ලා නොයෙක් වැඩ වර්ජන කිරීම සුලබ දෙයක් බවට පත් විය. කම්කරුවන්ගේ සේවා තත්ත්වය දියුණු කොට ගැනීම හා වැටුප් වැඩි කොට ගැනීම සඳහා උද්ඝෝෂණය කිරීම 20 වන සියවසේ දෙවන දශකයේ ආරම්භ වූ අතර එහි නායකත්වය ඉසිලුවේ ඒ. ඊ. ගුණසිංහ මහතා ය.



2.8 රූපය
දොස්තර එස්.ඒ් වික්‍රමසිංහ මහතා

වතු කම්කරුවන් වෘත්තීය සංගම් වශයෙන් සංවිධානය වන්නට පටන් ගන්නේ 1935 දීය. එහි නායකත්වය ගත්තේ නටේසර් අයියර් නැමැත්තා ය. මධ්‍යම පංතික පවුල්වලට අයත් තරුණ පිරිස් මේ වන විට එංගලන්තයේ අධ්‍යාපනය ලබා මාක්ස්වාදී දේශපාලන න්‍යායන්ගේ ආභාෂය ලබා ශ්‍රී ලංකාවට පැමිණ කම්කරු පංතිය සංවිධානය කරන්නට වූහ. 1935 පමණ වනවිට ලංකා සමසමාජ පක්ෂය බිහි වූ අතර පිලිප් ගුණවර්ධන, දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ, ආචාර්ය එන්. එම්. පෙරේරා වැනි අය එහි මූලිකත්වය දැරූහ. පසු කාලයේ මොවුහු නාගරික හා වතුකම්කරුවන් යන කොටස් දෙක ම තුළ වෘත්තීය සංගම් පිහිටුවා කම්කරුවන් සංවිධානය කිරීමෙහි ලා මූලිකත්වය ගත්හ.

## ශිෂ්‍ය ක්‍රියාකාරකම

1. ශ්‍රී ලංකාවේ පැරණි අවධියේ සිට ක්‍රියාත්මක වූ ශ්‍රම ක්‍රමය පිළිබඳ රචනාවක් ලියන්න.

2. ''අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමයට වඩා වේතන ලබන ශ්‍රම ක්‍රමය යහපත් ය.'' යන මාතෘකාවට පක්ෂව හා විපක්ෂව විවාදයක් පවත්වන්න.

3. 20 වන සියවසේ ශ්‍රී ලංකාවේ මධ්‍යම පංතියක් නැගී ආ ආකාරය පිළිබඳ තොරතුරු එක් රැස් කොට පොත් පිංචක් සකස් කරන්න.

4. ඉංග්‍රීසීන් යටතේ කම්කරු පංතියේ ආරම්භයට සහ වර්ධනයට අදාළ පහත දැක්වෙන නිවැරදි ප්‍රකාශය යටින් ඉරක් අඳින්න.

   (I) 1800 දී ප්‍රධාන වශයෙන් පැවතියේ වේතන ලබන ශ්‍රම ක්‍රමයකි / අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමයකි.

   (II) 1833 දී ක්‍රියාත්මක කෙළේ වේතන ලබන ශ්‍රම ක්‍රමයකි / අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමයකි.

   (III) 1833 සිට මෙරටට ගෙන්වූ ඉන්දීය කම්කරුවන් බහුලව ජීවත් වූයේ නගරවලය / වතුවලය.

(IV) දේශීය කම්කරුවන් වැඩිපුර ශ්‍රමය සැපයුවේ නගරවලය / වතුවල ය.

**(V)** නාගරික කම්කරුවන්ගේ පළමු වන නායකයා වූයේ, ඒ.ඊ. ගුණසිංහ මහතා ය / එන්.එම්. පෙරේරා මහතා ය.

**(VI)** වතු කම්කරුවන්ට මුලින් ම නායකත්වය දුන්නේ නටේසර් අයියර් මහතා ය / දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහතා ය.

**(VII)** මෙරට කම්කරු සටන්වලදී මධ්‍යම පංතියේ සහයෝගය ලැබිණි / නොලැබිණි.

**(VIII)** මුල් ම වැඩ වර්ජනය වූයේ කොළඹ මුද්‍රණකරුවන්ගේ වර්ජනය යි / වැල්ලවත්ත රෙදි මෝලේ වර්ජනය යි.

**(IX)** වතු කම්කරුවන් වෘත්තීය සමිති පිහිටුවා ගත්තේ 1835 දී ය / 1935 දී ය.